# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2339/39 – 2023 ජූලි මස 08 වැනි සෙනසුරාදා – 2023.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

මගේ අංකය: 4-3/15/2011/VE/326.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: නා/ඉ/1/අත්/2009/1.

අංක 2316/33 හා 2023.01.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ නියමයෙහි උපලේඛනය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පළාත සුළු කොට්ඨාසයේ, අංක 504ඒ, මැද මාවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාවිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පු 5192 හා 2015.07.31 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අංක 12 – කීණකැලේ වත්ත 3×6 කොටස – ප්‍රමාණය: හෙක්. 0.0491

උතුරට සහ නැගෙනහිරට: ආර්. ජේ. ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් කියන කීණකැලේ වත්ත 3×6 කොටස (හිපි 50324); දකුණට: කැබලි අංක 16; බටහිරට: කැබලි අංක 13 සහ 11.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 ජූනි මස 21 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 07 - 0046


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1945/13 හා 2015.12.15 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දවූ ද, 2015 අංක 231 හා 2015.12.07 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස් අතරින් මෙහි පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින් සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1945/13 හා 2015.12.15 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් 2015 අංක 231 හා 2015.12.07 වැනි දින දරන ආඥාව මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි සම්බන්ධයෙන් පමණක් මෙයින් අවලංගු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/328.

ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/KB/18.

2023 මැයි මස 24 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුම්බෝවිල, කටුවාවල සහ වේරහැර බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2012/1096 හා 2013.10.04 දිනැති අනුරේඛනයේ දැක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 26 – කොට්ටේ මහපිල්ලෑව – ප්‍රමාණය: හෙක්. 0.0174.**

උතුරට: කැබලි අංක 27 සහ 3; නැගෙනහිරට: කැබලි අංක 3; දකුණට: කැබලි අංක 3 සහ 25; බටහිරට: කැබලි අංක 25 සහ 27.

02. **කැබලි අංක 27 – කොට්ටේ මහපිල්ලෑව – ප්‍රමාණය: හෙක්. 0.0402.**

උතුරට: කැබලි අංක 28 සහ 3; නැගෙනහිරට: කැබලි අංක 3 සහ 26; දකුණට: කැබලි අංක 26 සහ 25; බටහිරට: කැබලි අංක 25 සහ 28.

03. **කැබලි අංක 32 – ඉඩමේ නම සඳහන් නොවේ – ප්‍රමාණය: හෙක්. 0.0371.**

උතුරට: කැබලි අංක 34, 35 සහ 31; නැගෙනහිරට: කැබලි අංක 31 සහ 23; දකුණට: කැබලි අංක 23 සහ 33; බටහිරට: කැබලි අංක 33 සහ 34.

EOG 07 – 0047

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.